කො ළඹ දිසා අධිකරණයේ දී ය.

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස්,
ඇචිලස් චතුරශ්‍රය,
ලෝටස් පාර,
කොළඹ 01.

පැමිණිලිකරු

නඩු අංකය: 15322/එම්.ආර්.

– එදිරිව –

ජිනාලි ශ්‍රී අමරසේකර,
කො මින්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

විත්තිකරු

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 95 වැනි වගන්තිය සමග කියැවෙන, 94 වැනි වගන්තිය යටතේ, ඉහත නම සඳහන් පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීම සඳහා, මෙයට යාකොට ඇති ආකෘතියේ ගෙනහැර දක්වා ඇති විචාරණ, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 97 වැනි වගන්තියේ විධිවිධානයන් යටතේ, එම අධ්‍යක්ෂවරුන් විසින් පිළිතුරු දිය යුතු බවට අණ කරමින්, පැමිණිලිකරු හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ්හී අධ්‍යක්ෂවරුන් වන, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති සුරේන් වික්‍රමසිංහ මහතා සහ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඒ.එස්.එම්. පෙරේරා මහතා වෙත භාර කරවීමට ගරු අධිකරණයේ අවසරය අයැද සිටිමු.

" එම විචාරණ ආපසු කැඳවීම සඳහා දිනයක්ද නියම කරන මෙන්ද ඉල්ලා සිටිමු.

විත්තිකරුගේ නීතිඥ මහතාට මෙම ඉල්ලීම තහවුරු කර සිටීමට හැකිවන සේ, මෙම නඩුව අද්‍ය 1995 මාර්තු මස 15 වැනි දින විවෘත අධිකරණයේ කැඳවන මෙන්ද, වැඩිදුරටත් ගෞරව පූර්වකව ඉල්ලා සිටිමු.

1995 මාර්තු මස 15 වැනි දින දීය

Desilva

විත්තිකරුගේ නීතිඥවරු

| කොළඹ | දිසා | අධිකරණයේ දී ය. |
|---|---|---|

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
හිල්ටන් ඒපෝට්ස් කම්ප්ලෙක්ස්,
ඇව්ලන් චතුරශ්‍රය,
ලෝටස් පාර,
කොළඹ 01.

පැමිණිලිකරු.

නඩු අංකය: 15322/එම්.ආර්.

- එදිරිව -

නියාලේ ශ්‍රී අමරසේකර,
කොමින්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

විත්තිකරු

ඉහත නම සඳහන් පැමිණිලිකරු වෙත ය,

( එහි අධ්‍යක්ෂවරුන්, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති සුරේන් වික්‍රමසිංහ මහතා සහ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඩී.එස්.එම්. පෙරේරා මහතා මගින් භාර කරවීම පිණිසයි.)

ඉහත නම සඳහන් පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීම සඳහා ඉහත නම සඳහන් විත්තිකරු වෙනුවෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වන වගන්තිය අනුව ප්‍රශ්න විචාරණ :

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වගන්තිය ප්‍රකාර, මෙය භාර කරවීමේ දිනයේ සිට දින දහය (10)ක් ඇතුලත පහත සඳහන් විචාරණයන්ට ඔබ විසින් පිළිතුරු සැපයිය යුතුය.

1.1 ඔබ සමාගමේ ව්‍යවස්ථාවලියේ 127 වන ව්‍යවස්ථාව ප්‍රකාර ඔවුන්ගේ නියෝජිතයන් වශයෙන් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ වන දෙකම ජපානය වන්නා වූ සී/ස මිට්සුයි සහ සා යිසේ කෝපරේෂන් සමාගම විසින් නම් කෙරුණු අධ්‍යක්ෂවරුන්ගෙන් අවම වශයෙන් එක් අයෙකුගේ පැමිණ සිටීම නො මැතිව, ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් සංස්ථාපිත කළ නො හැකි වන බව ඔබ පිළි ගන්නෙහි ද?

II ඔබ සමාගමේ ව්‍යවස්ථාවලියේ 129 ව්‍යවස්ථාව ප්‍රකාර, ඔබ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඔවුන්ගේ නියෝජිතයන් වශයෝ වන, දෙකම ජපානය වන්නා වූ, සී/ස. මිට්සුයි සහ සමාගම සහ තායිසේ කෝපරේෂන් සමාගම විසින් නම් කෙරුනු අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු හෝ එයට පක්ෂව ඡන්දය දුනහොත් මිස, යම් යෝජනා ස්ථිරත්වයක් සම්මත කිරීමට හෝ තීරණයක් ගැනීමට ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයට නො හැකි බව ඔබ පිළි ගන්නෙහිද?

2. I මෙම නඩුව පැවරීමට, උබ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිශ්චිත යෝජනා ස්ථිරත්වයක් හෝ තීරණයක් නො වුන බව ඔබ පිළි ගන්නෙහිද? එසේ වූවා නම්, එවැනි යෝජනා ස්ථිරත්වයක් සම්මත වූයේ හෝ තීරණයක් ගැනුනේ කෙදිනකද? යෝජනා ස්ථිරත්වය කුමක්ද? එවැනි යෝජනා ස්ථිරත්වයක් හෝ තීරණයක් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පසුව පැවති රැස්වීමක දී ස්ථිර කරන ලද්දේද? එසේ නම් එය කවදා ද?

II මෙම නඩුව පැවරීමට ඔබ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාට නියමිතව පැවරුනු බලයක් නොවන බව සහ ඔහු එසේ ක්‍රියා කරනු ලැබුයේ ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමිත බලයක් නො මැති ව, ඔහුගේ පෞද්ගලික ඕනෑකම් තකා, ද්වේශයෙන් යුතුව වන බව ඔබ පිළි ගන්නෙහි ද?

3. I ඔබ වෙනුවෙන් සහ ඔබගේ අයිතියෙන් සහ ඔබගේ යහපත සහ ඔබගේ එල ප්‍රයෝජනය තකා පමුණුවනු ලැබූ කො ළඹ දි.උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරන නඩු, නීතිපතිවරයා විසින් නිගා වට පත් කර තිබුණ තිබුණ වූ සමථය ගිවිසුම් ප්‍රකාර, සමථයට පත් කරන ලෙසට ජනාධිපති ඩී.බී.විජේතුංග නීතිපතිවරයාට උපදෙස් දුන් බවට 1994 ජුනි 05 සහ 1994 ජූලි 03 දිනයන්හි හෝ එයට ආසන්නයේ දී, "සන්ඩේ අයිලන්ඩ්" පුවත්පතේ පරස්පරයකින් තොරව වූ ප්‍රවෘත්ති වා ර්තා වන් පලවූ බව ඔබ පිළි ගන්නේද?

II 94 ජුනි 05 සහ 94 ජූලි 03 දිනයන්හි එම පුවත්පත් වා ර්තා වන්, වෙනත් දේ අතර, ඔබ සභාපති සහ කළමනාකා ර අධ්‍යක්ෂවරයා ඉවත් කිරීමද ඇතුළුව එම සමථයේ ගා න්දේසි ප්‍රකා ශයට පත්කර තිබූ බව ඔබ පිළි ගන්නෙහිද?

III අගෝස්තු මස 04 වන දින මෙම නඩුව පැ වරීමට පෙරාතුව 94 ජූලි 05 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී එම පුවත්පත් වා ර්තා ව පිලිබඳව වූ කා රණය සාකච්ඡාවට විෂය වුනු බව ඔබ පිළි ගන්නෙහිද?

4. නීතිපතිවරයා විසින් නිගාවට පත් කර තිබූ එවැ නි සමථයන් සහ එය යටතේ යෝජිත ඔහුගේ ඉවත් කිරීමත් නිෂ්ඵල සහ අවහිර කිරීමට ඔබ සභාපති සහ කළමනාකා රවරයා එයාකා ර බලයකින් තො රව මෙම නඩුව පවරා ඇති බව ඔබ පිළි ගන්නෙහිද?

5. ඔබ ප්‍රාග්ධන කො ටසින් 64.0%ක් ශ්‍රී ලංකා රජය සතු බව සහ ඔබ වෙනුවෙන්, දෙකම ජයානය වන සී/ස. පිටිසුයි සහ සමාගම සහ තා යිසේ කෝපරේෂන් සමාගම වෙත ශ්‍රී ලං කා රජය විසින් රාජ්‍ය ඇප සහතික පත් නිකුත් කරනු ලැබ ඇති බව සහ එම රාජ්‍ය ඇප සහතික යටතේ ගෙනහැර පා ඇති ඉල්ලීම් අද දිනට එක්සත් ජනපද ඩොලර් මිලියන 280.0ක්, ශ්‍රී ලංකා රුපියල් මිලියන 14,000ක් ඉක්මවන බව ඔබ පිළි ගන්නෙහිද? නැ තිනම්, සී/ස. පිටිසුයි සහ සමා ගම සහ තා යිසේ කෝපරේෂන් සමාගම විසින් ගෙනහැර පා ඇති ඉල්ලීම්වල වටිනාකම කො පෙක්ද?

6\. I   කොළඹ දි. උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරන නඩු පවරනු ලැබ ඇත්තේ නීතියෙන් ව්‍යුත්පන්න නඩුකරයක් වශයෙන්, ඔබ වෙනුවෙන් සහ ඔබගේ අයිතීන් මත, ඔබගේ ඕහපත සහ ඔබගේ එල ප්‍රයෝජනය තකා වන බව සහ නිකුත් කරනු ලැබ ඇති ඉහත කී රාජ්‍ය ඇප සහතික පත්වල බැඳියාවන් එම නඩු මහජන යහපත තකා ද වන බව ඔබ පිළි ගන්නෙහි ද?

II   දිසා අධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය දෙකම විසින්, එකී කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරණ නඩුව පැවරීමට, පැවති තත්වයන් අනුව, පැමිණිලිකරුගේ අයිතිය පිළිගෙන ඇති බව ඔබ පිළිගන්නෙහිද ?

III   නිකුත් කරනු ලැබ ඇති රාජ්‍ය ඇප සහතිකපත් යටතේ ඔබ සහ/හෝ ශ්‍රී ලංකා රජය විසින්, සී/ස. පිට්සුයි සහ සමාගම සහ තායිසේ කෝපරේෂන් සමාගම වෙත වෙනයම් ආකාරයක හෝ යම් ගෙවීමක් කිරීම වලක්වාලමින්, දෙකම ජපානය වන සී/ස පිට්සුයි සහ සමාගමට සහ තායිසේ කෝපරේෂන් සමාගමටත් එරෙහිවත්, ඔබට එරෙහිවත්, කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුවේ අතුරු ඉන්ජන්ෂන් තහනම් නිකුත් කරනු ලැබ ඇති බව ඔබ පිළි ගන්නෙහිද?

IV   එකී අතුරු ඉන්ජන්ෂන් තහනම නිකුත් කිරීමේ සිය නියෝගයෙහි, වෙනත් දේ අතර, උගත් දිසා විනිසුරුතුමා විසින් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබ ඇති බව ඔබ පිළි ගන්නෙහිද?

- පිට්සුයි / තායිසේ වෙත ගෙවීම් කිරීම සඳහා පිළිගත හැකි පදනමක් දැනට නැත.

- අධ්‍යක්ෂවරුන් වන අනෙකුත් විත්තිකරුවන්, සමාගමට සම්බන්ධකම් සහ සමාගම පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයින් වශයෙන් මුදල් ගැනීමට ක්‍රියා කරමින්, නිවැරදි පරීක්ෂණයක් පැවැත්වීමට යුහුසුළු වී නැද්ද?

- එකී පුද්ගලයින් නිවැරදි පරීක්ෂණයක් පැවැත්වීම වලක්වන ලදුව, කොයි සවර හැටියකින් නමුත්, මුදල් ගෙවීම ඉෂ්ට කර දීමට ප්‍රයත්න දරයිද?

- කොන්ත්‍රාත් ගිවිසුම්වලට සහ විස්තර ප්‍රකාශ පත්‍රය හා සම්බන්ධ වැඩ සම්බන්ධ කාරණයන් පිළිබඳව ප්‍රශ්න නැගීම වලක්වාලීමට, මෙම පුද්ගලයින් සමාජයෙන් ලද බලය යොදවන්නේද?

- එකී පුද්ගලයින්ගේ සහයෝගතාවය, සමාගමේ කොටස්කරුවන්ගේ අයිතීන්ට පටහැනි වන බව හා එවැනි සහයෝගිත්වයකින් ක්‍රියා කිරීම කොටස්කරුවන්ගේ අයිතීන් පරාජය කිරීමට තුඩු දෙන ආකාරයකින් ද?

- මෙය පහදා දීමේ තත්ත්වය නිවැරදි නම්, මෙය සැබැවින් ම වංක සහයෝගයකින් ක්‍රියා කරනු ලබන සිද්ධියකි.

7. I එම කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුවේ ඔබ වෙනුවෙන් පෙනී සිටිනු ලබන නීතිපතිවරයා විසින් එයාකාරයෙන් ම ඔබට එරෙහිව නිකුත් කරනු ලැබූ අතුරු ඉන්ජන්ෂන් තහනම ද ඇතුළුව මෙම අතුරු ඉන්ජන්ෂන් තහනම්වලට එරෙහිව කිසිදු හෝ යම් විරෝධතාවයන් ඉදිරිපත් නො කළ බව ඔබ පිළි ගන්නෙහි ද?

II ඔබ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝර්නලී එල්. පෙරේරා මහතා සහ අධ්‍යක්ෂ ජේ. ඒන්. චොක්සි මහතා ද ඇතුළුව විත්තිකරුවන් වශයෙන් නම් කරනු ලැබ ඇති ස්වදේශීය අධ්‍යක්ෂවරුන් කිසියම් හෝ යම් විරෝධතාවයන් ඉදිරිපත් කළේවත්, කිසිදු උත්තරයක් හෝ ඉදිරිපත් කලේ හෝ නැති බව ඔබ පිළි ගන්නෙහි ද?

III කොළඹ දි. උ. 3155/විශේෂ දරන නඩුවේ ඔහුගේ සම්ප්‍රකාශයන් හැකි නම් පරස්පරව වාද කරන ලෙසට විත්තිකරු ස්වදේශීය අධ්‍යක්ෂවරුන් සියල්ලන්ටම ලිඛිතව අභියෝග කලේ වී නමුත්, ඔවුන්ගෙන් කිසිවෙකුට එසේ කළ හැකි වූයේවත් ඔවුන් එසේ කළේවත් නැති බව ඔබ පිළි ගන්නෙහිද?

8. I විත්තිකරුවන්ගේ උත්තරවාද, විරෝධතාවයන් සහ සැළ කිරීම් අභියස වුව ද, සමත් වීමේ නියත අවකාශයක් සහිතව එන්නා වූ හුදු බැල්මටම පෙනී යන වංචාවක බලවත් නඩුවක් පැමිණිලිකරු විසින් ස්ථාපිත කරනු ලැබ ඇති බව නිරීක්ෂණය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුවේ එම අතුරු ඉන්ජන්ෂන් තහනම් නිකුතුව පිළිගනු ලැබ ඇති බව ඔබ පිළි ගන්නෙහි ද?

II වෙනත් දේ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පහත සඳහන් නිරීක්ෂණයන් කළ බව ඔබ පිළි ගන්නෙහිද?

- නෛතිකව බලාත්මක කිරීමේ අයිතියක් ඔහු සතු බව සහ බරපතල ප්‍රශ්නයන් සහ හුදු බැල්මට ම පෙනී යන්නා වූ වංචාවක නඩුවක් සහ වරදකරුවන්ගේ පාලනයක් ඇති බවත් ස්ථාපිත කිරීමට පැමිණිලිකරු සමත් වී ඇති බව සහ ඉල්ලා ඇති සහනයන් සඳහා සමාගමට හිමිකම් ඇති බවත්,

- පැමිණිලිකරුගේ සමත් වීමේ අවකාශය නියතයක් වනු විනා කල්පනා මාත්‍රයක් නො වන බවත් හුදෙක් තර්ක කල හැකි නඩුවකට වංචා නඩුවක් ඔහුට ඇති බව.

- නඩුවේ උද්ගත හේතු සාධක අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ රජයේ නියෝජිතයින් ද ඇතුළුව අධ්‍යක්ෂවරුන් විසින් සහයෝගය දීමක් නොකරන අතර, මැදිහත් වීමට නොහැකි ව ඔවුන් අසරණ වී ඇති බව.

- අතුරු ඉන්ජන්ෂන් තහනම් ප්‍රදානය කරනු ලැබුවේ රටෙන් සහ සමාගමෙන් "මුදල් කඩා ලෙස පිටතට ඇදීයාම" වලක්වාලීමට වන බව.

- අතුරු ඉන්ජන්ෂන් තහනම් නොවන්නට ඇපුලියාවේ ඇස්කියුලම් සංග්‍රාමයෙන් පසු ජයිරස් මෙන්, මෙවැනි තවත් එක් ජයග්‍රහනයක් ලදහොත්, අප පරාදය, යනුවෙන් පැවසීමට සමාගමට ඒකා න්තයෙන් ම සිදු වනු ඇතැයි යන බව.

- රජය විසින් ඇප සහතික පත් නිකුත් කිරීම මගින් සමාගම විසින් ණයට ගත් මුදල් ආපසු ගෙවීමට වගකීම රජය විසින් පවරා ගෙන ඇති හෙයින් රජයට උදාසීන වීමට මෙය කාරණයක් නොවන බව පෙන්වා දිය හැකිය යන්න.

9. I කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුවේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වූ ලිඛිත සැල කිරීම්වල වෙනත් දේ අතර, 36 සිට 44 දක්වා පිටුවල ඔවුන්ගේ වැරදි ක්‍රියාවන් පැහැදිලිවම ගෙනහැර දක්වමින්, පැමිණිලිකරු විසින් පහත සඳහන් ඔබගේ අධ්‍යක්ෂවරු වරද කළවුන් ලෙස නම් කර තිබූ බව ඔබ පිළි ගන්නෙහිද?

ඔබගේ සභාපති සහ කලමනාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්. පෙරේරා මහතා,

අධ්‍යක්ෂ, ජේ. එන්. වොක්සි මහතා,
විධායක අධ්‍යක්ෂ, ඊ. නකා මහතා,
විධායක අධ්‍යක්ෂ එච්. ඔගාමි මහතා

II ඔබගේ යහපතට අහිතකර වන්නා වූ, ඔවුන් විසින් කළ නීත්‍ය වැරදි ක්‍රියාවන් ඔවුන් එක් එක් අයෙකුගේ නම් ඉදිරියේ එකී ලිඛිත සැල කිරීම්හි 36 - 44 පිටුවල ගෙනහැර දක්වා තිබුනු බව ඔබ පිළි ගන්නෙහිද?

III ඔබගේ සහ ඔබ කොටස් දරන්නාන්ට ද අහිතකර වූ එවැනි තදබල වැරදි ක්‍රියාවන් පිළිබඳව කිසිදු හෝ යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය අසමත් ව පැහැර හරින ලද බව ඔබ පිළි ගන්නේද?

IV යම් කිසිදු හෝ ක්‍රියා මාර්ගයක් නො ගැනීමෙන් මෙම වංචාව පිළිබඳව වූ කාරණය හිතා මතා ම යටපත් කිරීමට ඔබගේ අනිකුත් අධ්‍යක්ෂවරුන් එක සහායකත්වයෙන් ක්‍රියා කරනු ලැබ ඇති බව ඔබ ක්‍රියා කරනු ලැබ ඇ? බව ඔබ පිළි ගන්නේද?

V ඔබටත් ඔබ කොටස් දරන්නන්ටත් පවුණුවනු ලැබූ වංචාවක් සම්බන්ධව වූ එවැනි බරපතල සහ තදබල වැරදි කිරීම් පිළිබඳව කිසියම් හෝ ක්‍රියාවක් ගැනීමට අසමත් වන ලදුව එයට හාත්පසින් ම, ඔබගේම සහ ඔබගේ කොටස් දරන්නන්ගේ ද නිකුත් කරනු ලැබ ඇති රාජ්‍ය ඇප සහතික පත්වල සම්බන්ධතාවයෙන් ශ්‍රී ලංකා රජය සහ මහජනයාගේ ද යහපත සහ එල ප්‍රයෝජනය තකා වන විත්තිකරුගේ ඉහත කී නඩු නිශ්ඵල සහ අවහිර කිරීමට විත්තිකරුට විරුද්ධව මෙම නඩුව පවරනු ලැබ ඇත්තේ සෘජු ද්වේශයෙන් යුතුව වන බව ඔබ පිළි ගන්නෙහිද? „

10. I මෙම නඩුවේම විෂය වස්තුව වන්නා වූ කාරණය පදනම මත විත්තිකරුට එරෙහිව නීතිඥ ජෝන් විල්සන් මහතා මගින් 1994 ජූලි 29 වන දින හෝ එදිනට ආසන්නයේ දී පැමිණිල්ලක් කරවීමට ඔබ කටයුතු කළ බව ඔබ පිළි ගන්නේද?

II එවන් පැමිණිල්ලක් කිරීමට එකී නීතිඥ ජෝන් විල්සන් මහතා ට බලය පැවරෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්මතයක් නොමැති බව ඔබ පිළි ගන්නෙහිද?

එසේ තිබුණේ නම්, එම 'යෝජනා සම්මතය' වූයේ දෙකිනද? සහ එහි ප්‍රකාශය වූයේ කුමක්ද?

III ඔබ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝනල් එල්. පෙරේරා මහතා විසින් එවන් පැමිණිල්ලක් කරවා ඇත්තේ සෘජු ද්වේශයෙන් යුතු ව ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශිත බලයකින් තොරව සහ අසද්භාවයෙන් වන බව සහ විත්තිකරුගේ ඉහත කී නඩුව නිෂ්ඵල සහ අවහිර කරවීමට වන බවත් ඔබ පිළි ගන්නෙහිද?

11. I නීතිපතිවරයා විසින් නිමාවට පත් කරවා තිබූ සමථය ගිවිසුම් වෙනස් කරවීමට, විශේෂයෙන් ඔබ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ කෝනල් එල්. පෙරේරා මහතා ඉවත් කිරීමට යෝජිත වූ කොන්දේසිය ඉවත ලෑමට විත්තිකරු වෙත බල කිරීම් එල්ල වුණු බව ඔබ පිළි ගන්නෙහිද?

II එම බල කිරීම් නොතකමින් එකී සමථයේ ගිවිසුම්වල නියමයන් වෙනස් කිරීම විත්තිකරු තරයේම ප්‍රතික්ෂේප කළ බව සහ එම සමථයේ ගිවිසුම් අත්සන් නොකළ බව ඔබ පිළි ගන්නෙහිද?

III විත්තිකරු වෙත එල්ල වුන එවැනි බල කිරීම් ගැන, ඉහත කී කොළඹ දි.උ. අංක 3155/විශේෂ සහ 3231/ විශේෂ දරන නඩු දෙක සඳහා ඔබ වෙනුවෙන් පෙනී සිටිනු ලබන නීතිපතිවරයා දන්නා බව ඔබ පිළි ගන්නෙහිද?

12\. I ඔබ සමාගම බහුතර වශයෙන් රජය සතු වන්නක් වන හෙයින්, ඔබ වෙනුවෙන් නඩුවක් පැවරීමට සාමාන්‍යයෙන් ලේඛනගත නීතිඥවරයා වනුයේ නීතිපතිවරයා වන බව ඔබ පිළිගන්නෙහිද?

II එවැනි සාමාන්‍ය අවශ්‍යතාවයට පටහැනිව, ප්‍රශ්නයට තුඩුදෙන අයුරින් ඔබ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්. පෙරේරා මහතා විසින් මෙම නඩුව පවරනු ලැබුවේ ඩනන් නීතිඥවරයෙකු එනම් හුසේන් අහමඩ් මහතා මගින් වන බව ඔබ පිළිගන්නෙහිද?

III එකී හුසේන් අහමඩ් මහතා වෙත පෙරකලාසියක් ප්‍රදානය කරවීමට ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිත්‍ය යෝජනා සම්මතයක් හෝ වන බව ඔබ පිළිගන්නෙහිද? එසේ නැතිනම්, එවැනි යෝජනා සම්මතයක් කොහිද? සහ එය සම්මත කරන ලද්දේ කවදා ද?

iv එසේ හෙයින්, ඔබගේ පොදු මුද්‍රාව යටතේ, ඔබ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්. පෙරේරා සහ ඔබ ලේකම්වරු කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින අත්සන් කොට ප්‍රදානය කළ පෙරකලාසිය නිසියාකාර නොවන්නක් සහ නීති විරෝධී සහ නීතියෙන් වලංගු නොවන්නක් බව ඔබ පිළිගන්නෙහිද ?

v ඔබ මුල් ආරම්භයේ සිටම ඔබගේ ලේකම්වරුවූ සිලෝන් සෙක්‍රටේරියල් සර්විසස් ලිමිටඩ් ඉවත්කොට ඒ වෙනුවට කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් මෙම නඩු පැවරීමට පෙරාතුව ඉතා ආසන්නයේදී 94මැයි සිට පත්කළ බව ඔබ පිළිගන්නෙහිද ?

13\. i 1994 අගෝස්තු මස 04 වැනි දින මෙම නඩුව පවරනු ලැබුවේ, 1994 අගෝස්තු මස 16 වැනි දින පැවති මහා මැතිවරණයට පෙරාතුව ඉතා ආසන්නයේදී බව ඔබ පිළිගන්නෙහිද?

II නව රජය 94 අගෝස්තු මස පත් වූ පසු ගරු මුදල් ඇමතිවරයා, දැනට අතිගරු ජනාධිපතිනිය විසින් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ රජයෙන් නම් කළ අධ්‍යක්ෂවරුන් 6 දෙනා ඉවත් කොට රජයෙන් නම් කළ නව අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකු පත්කළ බව ඔබ පිළිගන්නෙහිද?

III ගරු මුදල් ඇමතිවරයා එනම්, අතිගරු ජනාධිපතිනිය, විසින් ඔබ අධ්‍යක්ෂක මණ්ඩලයට එසේ පත් කරනු ලැබූ රජයෙන් නම් කළ අධ්‍යක්ෂවරුන් පහත සඳහන් අයවලුන් බව ඔබ පිළිගන්නෙහිද?

සුරේන් වික්‍රමසිංහ මහතා,
සභාපති, ආයෝජන සංවර්ධන අධිකාරිය.

නිහාල් ශ්‍රී අමරසේකර මහතා,
උපදේශක, මුදල් ක්‍රම සම්පාදක ජනවාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.

ආචාර්ය, පී.බී. ජයසුන්දර මහතා,
ආර්ථික උපදේශක, මුදල් අමාත්‍යාංශය.

පද්මා මහරාජා මහත්මිය,
අතිගරු ජනාධිපතිනියගේ අතිරේක ලේකම්.

ඒ.එස්.එම්. පෙරේරා මහතා ,
නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්.

කේ. කනග්-ඊස්වරන් මහතා,
ජනාධිපති නීතිඥ.

14.1 අතිගරු ජනාධිපතිනිය ජාතිය වෙත 94 දෙසැම්බර් මස ඇතුලත දී රූපවාහිණිය ඔස්සේ කල සම්මුඛ සාකච්ඡාවේ දී මෙම වංචාව මෙරටෙහි විශාලතම වංචාවන්ගෙන් එකක් වන බව ඉස්මතු කර සඳහන් කරන්නට යෙදුනු බව සහ එම සම්මුඛ සාකච්ඡාවට පුවත් පත් මගින් පුළුල් ප්‍රසිද්ධියක් දුන් බව ඔබ පිගන්නෙහිද?

II රාජ්‍ය ආයතනවල අයථා ක්‍රියා , වංචා සහ දූෂණ පරීක්ෂා කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත නිකුත් කරනු ලැබූ අධිකාර පත්‍රයේ, ඔබ රාජ්‍ය ආයතනයක් වීමෙන්, ඉහත සඳහන් කරනු ලැබූ කාරණය හා ඒ හා සම්බන්ධ රජය සහ අනෙකුත් රාජ්‍ය ආයතන විසින් කරන ලද ක්‍රියාවන් සහ පැහැර හැරීම් ද ඇතුළුව, අතිගරු ජනාධිපතිනිය විසින් නිකුත් කළ අධිකාර පත්‍රය ප්‍රකාර එවැනි පරීක්ෂණයක් කාරණ අංක 2 වශයෙන් ලැයිස්තු ගත කොට තිබෙන බව ඔබ පිළි ගන්නෙහි ද?

15. ඔබ වෙත පමුණුවනු ලැබූ එවැනි වංචාවක් පිළිබඳව අවශ්‍ය කෙරෙන පරිද්දෙන් නිසි කටයුතු කිරීමේ නව රජයේ අභිප්‍රාය නිශ්ඵල කරමින් ඉහත නම් සඳහන් රජයෙන් නම් කළ නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමෙන් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිසංස්ථාපනය වීමෙන් පසු, ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් එකකුදු හෝ ඔබ නො පැවැත්වූ බව ඔබ පිළි ගන්නෙහිද?

16.1 ඔබ වෙත පමුණුවන ලද එකී වංචාව පිළිබඳව අවශ්‍ය කෙරෙන පරිද්දෙන් නිවැරදි කිරීමේ කාර්යයන් නිවැරදි කිරීමෙහි ලා රජයෙන් නම් කළ අධ්‍යක්ෂවරුන්ගේ යම් පරිශ්‍රමයක්, විපරියාසයට ලක් කරමින් , දෙකම ජපානය වන සී/ස මිට්සුයි සහ සමාගම සහ තා යිසෙයි කෝපරේෂන සමාගම ඔබ ව්‍යවස්ථාවලියේ 127 ව්‍යවස්ථාව යටතේ ඇති ඔවුන්ගේ බලතල උපයෝගී කර ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම ප්‍රතික්ෂේප කරන ලද බව ඔබ පිළි ගන්නෙහි ද?

II හුවා දක්වන ලද තත්ත්වයන් යටතේ රජයට පිටු පා සිටිය නො හැකි බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිරීක්ෂණය කළ බව ඔබ පිළි ගන්නෙහි ද?

17.1 ඉහත සඳහන් පරිද්දෙන් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිසංස්ථාපනය කළ අවස්ථාවේ සිට ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු රැස්වීමක් පැවැත්වීමට ඔබ අසමත් වීමෙන්, රජයෙන් නම් කල අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති සුරේන් වික්‍රමසිංහ මහතා විසින් ඔහුගේ 1995 මාර්තු 01 වන දින දරන ලිපියෙන් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් ඉල්ලා සිටි බව ඔබ පිළි ගන්නෙහි ද?

II   එම ව්‍යවස්ථාවලියේ 127 ව්‍යවස්ථාව ප්‍රකාර සම්පූර්ණයක් සංස්ථාපනය වීමට ඔවුන්ගේ පැමිණ සිටීම අවශ්‍ය කෙරුනු අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක්, එමගින් වලක්වාලමින්, දෙකම ජපානයේ වන සී/ස. මිට්සුයි සමාගමේ සහ තායිසේ සමාගමේ අධ්‍යක්ෂවරුන්, එවන් අධ්‍යක්ෂවරුන් දෙදෙනාම ශ්‍රී ලංකාවේ පදිංචිව සිටියදීත්, එවැනි රැස්වීමකට පැමිණිය නොහැකි බව දන්වා සිටි බව ඔබ පිළි ගන්නෙහිද?

III   1994 දෙසැම්බර් මාසේ ඉහත දී අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දැන්වීමක් දීමට ඔබ ලේකම්වරු උත්සාහ දරා සිටියද, සී/ස. මිට්සුයි හා සමාගම සහ තායිසේ කෝපරේෂන් සමාගම විසින් නම් කෙරුනු ශ්‍රී ලංකාවේ පදිංචි අධ්‍යක්ෂවරුන් විසින් එවැනි රැස්වීමක් පැවැත්වීමට කැමැත්ත දීම ප්‍රතික්ෂේප කළ බව ඔබ දන්නෙහිද?

18. I   මෙම නඩුවේ විත්තිකරු විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති, ඔබට විරුද්ධව ඔහුගේ හරස් ඉල්ලීම ද සහිතව වන, උත්තරය ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමකදී සභාගත කිරීමක් සහ සලකා බැලීමක් කර නොමැති බව ඔබ පිළි ගන්නෙහිද? එසේ වූවා නම් එවැනි රැස්වීමක් පැවැත්වූයේ කවදාද?

II   එවන් තත්වයක් යටතේ ඔබගේ ලේඛණගත නීතිඥවරයා විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති ප්‍රති උත්තරය ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් යම් බලයක් සහ/හෝ යම් උපදෙස්වලින් තොරව වන්නක් බව සහ ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා භාජනයකින් සහ සලකා බැලීමකින් තොරව වන්නක් බවත් ඔබ පිළි ගන්නෙහිද?

19. I   ඔබගේ මුල් ආරම්භයේ සිටම 90.3.31 දක්වා ඔබගේ වාර්ෂික ගිණුම් වරලත් ගණකාධිකාරීවරුන් වන ෆෝර්ඩ් රෝඩ්ස් තෝර්න්ටන් යන සමාගම විසින් විගණනය කල බව ඔබ පිළි ගන්නෙහිද?

II   ඔබ ගණන් පරීක්ෂකවරුන් විසින් ඔවුන්ගේ ලෘත කී වාර්ෂික වාර්තා වෙහි කිසි විටෙක වත්, මෙම නඩුවෙහි විෂය වස්තුව වන ණය මත ගෙවියයුතු පොලී මත වන බදු කිසිවක් පිලිබඳව වූ කාරණය ගැන වාර්තා නොකල බව ඔබ පිළි ගන්නෙහිද?

III   එසේ වූයේ නම් එවන් කාරණයක් පිලිබඳව වාර්තා කිරීම එම ගණන් පරීක්ෂකවරුන්ගේ යුතුකම් සහ වගකීම වන බව ඔබ පිළි ගන්නෙහිද?, එසේ නැතිනම් ඒ මන්ද?

IV   ඔබගේ බදු කටයුතු ඔබ මුල් ආරම්භයේ සිටම එම ගණන් පරීක්ෂකවරුන්ගේ වගකීම වන බව සහ ඒ අනුව ඔවුන් ඊට මෙම කාරනයේදී ඔවුන් යෙදීය යුතු ව තිබුනු බව ඔබ පිළි ගන්නෙහිද?

20. I 1990 නොවැම්බර් මසදී එම ගණන් පරීක්ෂකවරුන් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය හා වංක සහායකත්වයෙන් ක්‍රියා කරමින් ඔබ වෙත පමුණුවන ලද වංචාව පිළිබඳව වූ කාරණය හා එම වංචාව සම්බන්ධයෙන් එයට කලින් 90 සැප්. මසදී පමුණුවා තිබූ කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුව සහ අධිකරණය විසින් එවකටත් වාරණ නියෝගයක් නිකුත් කර තිබියදීත් එය හිතාමතාම යටපත් කරමින් 90.3.31 දිනට වූ වාර්ෂික ගිණුම් සහතික කරන ලද බව ඔබ පිළි ගන්නෙහිද?

II එවකට අධ්‍යක්ෂවරයෙකුව සිටි විත්තිකරු එකී කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුව පවරනු ලැබ, එම වාර්ෂික ගිණුම් එසේ සහතික කිරීමට පෙරාතුව එම වාර්ෂික ගිණුම්වලට විරුද්ධ වී ඒවා නිෂ්ප්‍රභා කරන ලද බව ඔබ පිළි ගන්නෙහිද?

III ඉන් අනතුරුව විත්තිකරු විසින් කොළඹ දි.උ. අංක 3231/විශේෂ දරන නඩුව පවරන ලද බව හා 90.3.31 දිනට වූ ඉහත කී වාර්ෂික ගිණුම් මේ දක්වාම අධිකරණය විසින් වාරණය කරනු ලැබ ඇති බව ඔබ පිළි ගන්නෙහිද?

IV තත්ත්වයන් එසේතුදු තිබියදීත් එම ගණන් පරීක්ෂකවරුන්ට එරෙහිව කිසිදු යෝග්‍ය ක්‍රියාමාර්ගයක් ගැනීමට ඔබ ආයතන අධ්‍යක්ෂ මණ්ඩලය හිතාමතාම අසමත්ව පැහැර හැර ඇති බව ඔබ පිළි ගන්නෙහිද? ඒ මන්ද?

21. I ඔබ [illegible] ආයතනයේ සී/ස. පිටිපුරි සහ සමාගමේ නියෝජිත ඊ. නකා මහතා 1984 මාර්තු මස 04 වන දින සිට විධායක අ[illegible] බව සහ ඔබ වූ [illegible] කෝර්නල් එල්. පෙරේරා මහතා [illegible] සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ වන බව ඔබ පිළි ගන්නෙහිද?

II මෙම කාරණය [illegible] ගණන් පරීක්ෂකවරුන් සමග ක්‍රියා කිරීම ඔබ විධායක අධ්‍යක්ෂ ඊ. නකා මහතාගේ සහ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්. පෙරේරා මහතාගේ යුතුකම සහ වගකීම වූ බව ඔබ පිළි ගන්නෙහිද?

22. I විත්තිකරු විසින් ලියන ලද්දා වූ, මෙම නඩුවෙහි ලකුණු කර ඇති ලිපි ලියන ලද්දේ ඔබගේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් වූ ඔහුගේ ශක්නුතාවයෙන් වන බව සහ ඊ. නකා මහතා ඔබගේ විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් තනතුරු භාර ගැනීමට පෙරාතුව වන බව ඔබ පිළි ගන්නෙහිද?

II විත්තිකරු කිසිවිටෙකවත් ඔබ විධායක අධ්‍යක්ෂවරයෙකු නොවුන බව සහ මෙම නඩුවේ විෂය වස්තුව පිළිබඳ අය ගැසීමකට ඔහු ව මෘත්තිය වශයෙන් කිසි විටෙකවත් නොයෙදූ බව ඔබ පිළි ගන්නේද?

23. මෙම නඩුවට ලකුණු කර යොමු කර ඇති, ආයෝජන ගිවිසුමෙහි 17.02 වගවස්ථාව ප්‍රකාර මෙම නඩුවේ විෂය වස්තුව වන ණයවලට පොලී මත ඒවා නි බදු නිදහස් ලබා ගැනීම සීමාසහිත කෝර්නල් සහ සමාගම සතු

සඳ වගකීම වූ බව ඔබ පිළි ගන්නෙහිද? එසේ නැත්නම් 17.02 ව්‍යවස්ථාවේ ඇත්වෙන්නේ කුමක්ද?

24. I මෙම නඩුවේ පැමිණිල්ලේ 'සී' වශයෙන් සලකුණු කර ඇති ලිපිය, මෙම නඩුවේ පැමිණිල්ලට 'බී' වශයෙන් සලකුණු කර ඇති ලිපියට පිළිතුරක් නොවන බවත්, නමුත් එය මෙම නඩුවේ උත්තරයට 'ඩී2සී' වශයෙන් සලකුණු කර ඇති ටෙලෙක්ස් පණිවුඩය ඇමුණුමක් ලෙස ඇතුළත් වූ 'ඩී2ඒ' වශයෙන් සලකුණු කර ඇති ලිපියට පිළිතුරක් වන බව ඔබ පිළි ගන්නෙහිද?

II උත්තරයට 'ඩී2සී' වශයෙන් සලකුණු කර ඇති ඔවුන්ගේ ටෙලෙක්ස් පණිවුඩය ප්‍රකාර උත්තරයට 'ඩී2ඒ' වශයෙන් සලකුණු කර ඇති ලිපිය, දෙකම ප්‍රකාශය වන සී/ස ජිවිසුයි සහ සමාගම හා තා යියෙංසිං කෝපරේෂන් සමාගම කර ඇති කරුණු දැක්වීම් මත වන බව ඔබ පිළි ගන්නෙහිද?

III ඒ අනුව, පැමිණිල්ලෙහි දෝෂාරෝපනයෙහි පදනම, එහි පදනමින් ම අස්ථානගත වූවක් සහ වැරදි සංකල්පයකින් යුතුව වන එකක් බව ඔබ පිළි ගන්නෙහිද?

IV උත්තරයට 'ඩී2සී' වශයෙන් සලකුණු කර ඇති ටෙලෙක්ස් පණිවුඩයේ ඔවුන් විසින්ම කර ඇති ඔවුන්ගේ කරුණු දැක්වීම් ප්‍රකාරව පසුපස ගොස් අවශ්‍ය සිද්ධාන්ත සහ සාධක සහිතව කරුණු තහවුරු කොට මෙම නඩුවේ විෂය වස්තුව වන ඔවුන්ගේ ණයවලට බදු සහන ලබා ගැනීම සී/ස ජිවිසුයි සහ සමාගමේ සහ තා යියෙයි කෝපරේෂන් සමාගමේ වගකීම සහ යුතුකම වූන බව ඔබ පිළි ගන්නෙහිද?

25. ඉහත සඳහන් පරිදි, පෙන්නුම් කර ඇති තත්ත්වයන් අනුව විත්තිකරුට එරෙහිව මෙම නඩුව පැවරීම සම්පූර්ණයෙන්ම පදනම් විරහිතව යම් කිසිදු ප්‍රතිෂ්ඨාපයක් නොමැතිව ද්වේශයෙන් යුතුව වන බව සහ අසද්භාවයෙන් වන එකක් බවත්, කිසියම් හෝ නඩුවක් උද්ගත වූයේ නම් එය පැවරිය යුතු ව තිබුනේ ඉහත සඳහන් පරිදි, අනෙකුත් වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව වන බව ඔබ පිළි ගන්නෙහිද?

1995ක් වූ මාර්තු මස 15 දින දී ය.

විත්තිකරුගේ නීතිඥවරු.

කොළඹ දිසා අධිකරණයේදිය.

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,

හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස්

ඇට්ලස් චතුරස්‍රය,

ලෝටස් පාර,

කොළඹ 01.

පැමිණිලිකරු

නඩු අංකය: 15322/එම්.ආර්.

\- එදිරිව -

නිහාල් ශ්‍රී අමරසේකර,

කොම්ප්ටන්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්,

167/4, ශ්‍රී විපුලසේන මාවත,

කොළඹ 10.

විත්තිකරු.

......

8) 95.3.15

තා.ස. (7) ඉල්ලීම තහවුරු කිරීම

ඉල්ලීම තහවුරු කරයි.

විවාරණ නිකුත් කරන්න. පිළිතුරු 95.4.26 දිනට

සැපයීමට.

අත්/කලේ.. දිසා විනිසුරු.

...



ඉහත්ත් සඳහන් වන්නේ කොළඹ දිසා අධිකරණයේ නඩු අංක 15322/එම් ආර් දරණ නඩුවේ තා.ස. 8 හි සත්‍ය පිටපතක් බවමෙයින් සහතිකකරමි.

යතු:

සැස:

අතිරේක රෙජිස්ට්‍රාර් / පිස්කල්
දිසා අධිකරණය
කොළඹ

P/19. 649674 95.3.2